# 22 දේව වන්දනාව

කිතුනු ජනතාව ඒකරාශි වී මුළු විශ්වයේ මැවුම්කාර දෙවියන් වහන්සේට ක්‍රිස්තුන් වහන්සේ මගින් කරන උතුම් ම වන්දනාව දේව වන්දනාව (ජන වන්දනාව) ලෙස අර්ථ දැක්විය හැකි ය. "දෙවියන් වහන්සේගේ මධ්‍යස්ථකයාණෝ" යන විශ්ව ලේඛනයේ අංක 20හි ජන වන්දනාව පිළිබඳ ව අති උතුම් xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා මෙසේ අර්ථ කථනය කරයි.

> අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහයේ හිස වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේත් එහි අවයව වන ශුද්ධ වූ සභාවත් දෙවියන් වහන්සේට කරන ප්‍රසිද්ධ පූර්ණ වන්දනාව ජනවන්දනාව වේ.

අතීන්ද්‍රීය ක්‍රිස්තු දේහය යනු ශුද්ධ වූ සභාව යි. එහි හිස ක්‍රිස්තුන් වහන්සේ ය. එහි අවයව වන්නේ ප්‍රසාද ස්නාපනය ලබා ශුද්ධ වූ සභාවේ සමාජිකයන් වූ කිතුනු අප ය. හිස මගින් ශරීරයේ සියලු අවයව පාලනය කරයි. එසේ ම ශුද්ධ වූ සභාවේ අවයව වූ අප එහි හිස වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ විසින් මෙහෙයවනු ලබන සේක. දෙවියන් වහන්සේට ප්‍රසන්න ලෙසින් දිවි ගෙවමින් අපගේ මුළු ජීවිතය ම දේව වන්දනාවක් කර ගැනීමට ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ අපට ආරාධනා කරන සේක.

දෙවන වතිකාන මන්ත්‍රණ සභාවේ ජන වන්දනාව පිළිබඳ ව්‍යවස්ථාවේ අංක 07 ජන වන්දනාව පිළිබඳ ව මෙබඳු විග්‍රහයක් කරයි.

> ජන වන්දනාව ක්‍රිස්තුන් වහන්සේගේ පූජක කාර්ය ඉදිරියට ගෙන යයි. ක්‍රිස්තු දේහය (ශුද්ධ වූ සභාව) ක්‍රිස්තුන් වහන්සේ තුළින් පියාණන් වහන්සේට පුදන පූර්ණ ප්‍රසිද්ධ වන්දනාව ජන වන්දනාව වේ.

මෙමගින් අරුත් ගැන්වෙන මූලික කරුණක් වන්නේ අප සැම එකමුතුව එකට එක්ව පුද කරන දේව වන්දනා පිළිවෙත දෙවියන් වහන්සේට ප්‍රසන්න පඬුරක් ලෙස පුද කරන තැනැත්තාණෝ ක්‍රිස්තුන් වහන්සේ ම බව ය. එමෙන් ම අපි සැම දින ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ කුරුසිය යාගය මත පිදූ ජීවිත පූජාවට දේව වන්දනාවේ දී සහභාගී වන්නෙමු. එහි දී එක ම ශරීරයක හිස වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ මගින් පියාණන් වහන්සේට අපගේ උතුම් නමස්කාරයත් වන්දනාවත් පුද කර සිටින්නෙමු.

ජනවන්දනාව සඳහා භාවිත වන ඉංග්‍රීසි වචන **ලිටර්ජි** (LITURGY) ය. එය **ලිටුර්ජියා** (LEITOURGIA) යන ග්‍රීක වචනයෙන් බිඳී එන්නකි. එය **ලාඕස්** (LAOS) හා **එර්ගොන්** (ERGON) යන වචනවලින් සෑදුම් ලද්දකි.

ලාඕස් = ජනතාව

එර්ගොන් = සේවයකි, වැඩකි.

මේ අනුව ජනතාව වෙනුවෙන් ඔවුන් උදෙසා කරන සේවය "**ලිටුර්ජියා**" යනුවෙන් මුල් කාලයේ දී හඳුන්වන ලදි. ග්‍රීක සමාජයේ මෙම වචනයට විවිධ අර්ථ කථන පැවතුණි. සිය ස්වාමියාට වැටුපක් නොලබා වහල් සේවකයෙකු කරනා කාර්යයන් සඳහා ද සිය මිතුරෙකු වෙනුවෙන් කරන්නා වූ දයාවේ ක්‍රියාවන් සඳහා ද සමාජයේ ප්‍රභූ අය විසින් ඉටු කරනු ලබන රාජකාරිමය සේවාවන් සඳහා ද මෙම වචනය භාවිත කෙරුණි.

කිතුනු අප ද දයාව සේවාවේ දී අන් අය වෙනුවෙන් කැඩෙමින් බිඳෙමින් අපගේ මුළු ජීවිතය ම ජනවන්දනාවක් කර ගැනීමට අදිටන් කර ගත යුතු ය. එබැවින් මම,

- පාසලේ හා මීසමේ සමිති සමාගම්වලට බැඳී අසරණ වූවන්ට සරණ වෙමි.
- අන් අයගේ දුක් වේදනා හමුවේ සංවේදී වී පිහිට වෙමි.
- මගේ ලෞකික සැපතේ දී පමණක් නොව අන් අයගේ සැපතේ දී ද සතුටු වෙමි.
- පාසලේ අසරණ වූ හා කොන් වූ සැමට කරුණාව දක්වමි.
- මා සතු දේ අන් අය හා බෙදා ගනිමි.
- ජනවන්දනා කටයුතු සංවිධානයේ දී සහාය වෙමි.

**ක්‍රියාකාරකම**

1. ජනවන්දනා පිළිබඳ ව්‍යවස්ථාවේ අංක 07 අනුව "ජනවන්දනාව" නිර්වචනය කරන්න.
2. අති උතුම් xii වන පියුස් ශුද්ධෝත්තම පියතුමා ජනවන්දනාව පිළිබඳ එළිදැක්වූ විශ්ව ලේඛනයේ නම කුමක් ද?
3. "ලිටුර්ජියා" යන්න සෑදී ඇති ග්‍රීක වචන දෙක ලියන්න.
4. ඔබ අන් අය වෙනුවෙන් කැප වී කටයුතු කළ අවස්ථා තුනක් විස්තර කරන්න.

**ජීවිතයට බිඳක්**

***අන් අය වෙනුවෙන් පරිත්‍යාගී වී සතුටු වන්න.***